2019. 09. 13. මව්බිම පිටු 13

# ප්‍රධාන වෙළෙඳ භාණ්ඩ අපනයනයෙන් 2018දී රුපියල් මිලියන 1,893,443ක ආදායමක්

බද්දේගම - ඕ. කමලනාථ

ප්‍රධාන වෙළෙඳ භාණ්ඩ අපනයනයෙන් 2018 වසරේ ශ්‍රී ලංකාව උපයාගත් ආදායම රුපියල් මිලියන 1,893,443ක් යැයි ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ශ්‍රී ලංකාවේ ආර්ථික දත්ත 2019 වාර්තාව පෙන්වා දෙයි. එහි දැක්වෙන පරිදි 2018 වසරේ, ඇඟලුම් අපනයනයෙන් ශ්‍රී ලංකාව උපයාගෙන ඇති ආදායම රුපියල් මිලියන 822,321කි. එහි ප්‍රතිශතය 43.4%කි. තේ (කළු සහ කොළ තේ) අපනයන ආදායම රුපියල් මිලියන 231,750කි. ප්‍රතිශතය 12.2%කි. රබර් අපනයන ආදායම රු.මි. 5,088කි. ප්‍රතිශතය 0.3%කි. පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම රු.මි. 67,381කි. ප්‍රතිශතය 3.6%කි. වටිනා පාෂාණ ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම රු.මි. 45,007කි. ප්‍රතිශතය 2%කි. වෙනත් යටතේ ගැනෙන අපනයන ආදායම රු.මි. 721,896කි. ප්‍රතිශතය 38.1%කි.